**26-12-2025** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබගේ භාග්‍යය උසස් කර ගැනීම සඳහා, ඔබ කෙනෙක් දෙස බලන විට හෝ කතා කරන විට, ඔබගේ බුද්ධියේ යෝගාව, එක් පියාට සම්බන්ධව තබාගන්න.

**ප්‍රශ්නය:** නව ලෝකය ස්ථාපිත කිරීමට උපකරණ වන දරුවන්ට පියාගෙන් ලැබී ඇති උපදෙස් මොනවාද?

**පිළිතුර:** දරුවනි, ඔබට මෙම පැරණි ලෝකය සමඟ කිසිම සම්බන්ධයක් නැත. මෙම පැරණි ලෝකයට ඔබගේ හදවත බැඳ නොතබන්න. ඔබ ශ්‍රීමත් වලට විරුද්ධ කිසි දෙයක් නොකරන බවටත්, ඔබ ආධ්‍යාත්මික සේවය සඳහා උපකරණ වනවාද, කියාත් පරීක්ෂා කර බලන්න.

**ගීතය:** අවිහිංසක ස්වාමි තරම් අසහාය කෙනෙක් නැත!

ඕම් ශාන්ති. දැන් ගීත අසන්නට අවශ්‍ය නැහැ. සාමාන්‍යයෙන් ගීත ගායනා කර ඒවාට සවන් දෙන්නේ බැතිමතුන්ය. ඔබ අධ්‍යයනයක් හදාරමින් සිටියි. මෙම ගීත විශේෂයෙන් නිර්මාණය කර තිබෙන්නේ ඔය දරුවන්ටයි. පරමාත්ම පියා ඔබගේ භාග්‍යය උසස් කරවන බව ඔය දරුවන් දන්නවා. අප දැන් පියාව සිහි කර, දිව්‍යමය ගුණදම් ධාරණය කළ යුතුයි, එපමණයි. ඔබ ලාභ ලබන්නේද පාඩු ලබන්නේද කියා ඔබගේ වාර්තාව පරීක්ෂා කර බලන්න. මා හට කුමන හෝ දුර්වලතා තිබේද? ඔබගේ භාග්‍යයේ පාඩුවක් සිදුකළ හැකි යම් දුර්වලතාවයක් තිබේ නම්, ඔබ එය ඉවත් කළ යුතුයි. මෙකල ඔබ සෑම කෙනෙක්ම ඔබගේ භාග්‍යය උසස් කළ යුතුයි. ඔබ පරමාත්ම පියා හැර වෙනත් කිසිවෙක් සිහි නොකරන්නේ නම් පමණයි, ඔබට ලක්ෂ්මි හෝ නාරායන් විය හැකි වන්නේ කියා, ඔබ විස්තර කර දෙයි. යමෙක් සමඟ කතා කරන විට හෝ කෙනෙක් දෙස බලන විට, ඔබගේ බුද්ධියේ යෝගාව එක් අය සමඟ සම්බන්ධ කර තබාගන්න. ජීවාත්ම වන අප, සිහි කළ යුත්තේ පරමාත්ම පියා පමණයි. අපට පියාගේ අණසක ලැබී තිබේ ඔබගේ හදවත මා හැර වෙනත් කිසිවෙකුට සම්බන්ධ කර නොගන්න, එමෙන්ම දිව්‍යමය ගුණධර්ම ධාරණය කරගන්න. පරමාත්ම පියා විස්තර කරන්නේ ඔබගේ උපත් 84 දැන් සම්පූර්ණ වී තිබේ. ඔබ දැන් ගොස් රාජධානියේ අංක එකේ තත්ත්වය හිමි කර ගත යුතුයි. ඔබ රාජධානියෙන් ඈද වැටී පුරවැසියන්ගේ කොටසක් නොවිය යුතුයි, පුරවැසියන්ගෙන්ද, පහත්ම අය නොවිය යුතුයි. නැත දිගින් දිගටම තමන්ව පරීක්ෂා කර බලන්න. පරම පියා හැර වෙනත් කිසිවෙකුට මෙම විස්තර කිරීම කළ නොහැක. පියා සහ ගුරුවරයා සිහි වීමෙන්, ඔබ දඬුවම් ලැබිය යුතු දෙයක් කරයිද, යන බියක් තිබේ. භක්ති මාර්ගයේ වුවද, පාපයන් සිදු කිරීමෙන්, ඔවුන් තමන්ටම දඬුවම් රැස් කරගන්නා බව ඔවුන්ට වැටහෙයි. ඔබට ජොෂ්ඨ බාබාගෙන් උපදෙස් ලැබෙන්නේ මෙකල පමණක් වන අතර, මේවාට ශ්‍රීමත් යැයි කියයි. ශ්‍රීමත් පිළිපැදීමෙන් ඔබ ශ්‍රේෂ්ඨත්වයට පත් වන බව, ඔය දරුවන් දන්නවා. ඔබ ශ්‍රීමත්වලට විරුද්ධ යමක් කරන්නේද කියා, ඔබ තමන්ව පරීක්ෂා කර බැලිය යුතුයි. ඔබ අකමැති කිසිවක් නොකළ යුතුයි. ඔබට දැන් හොඳ සහ නරක අතර වෙනස වැටහෙයි ඔබට මෙය මීන් පෙර වැටහුනේ නැත. බොහෝ උපත් ගණනාවකට ඔබගේ ක්‍රියා, අකර්ම බවට පත්වන අන්දමේ ක්‍රියාවන්, සිදු කිරීමට ඔබ දැන් ඉගෙනගන්නවා. මෙකල, පාපයන් පහ, සියල්ලන් තුළම පවතී. ඔබ දැන් ඉතා හොඳින් උත්සාහ දරා, කර්මාතීට විය යුතුයි. ඒ සමඟම දිව්‍යමය ගුණදම් ද ධාරණය කරගන්න. කාලය තව තවත් අනතුරුදායක වන අතර, ලෝකය එන්න එන්නම නරක අතට හැරෙනවා. සිදුවන්නේ, දිනෙන් දින සෑම දෙයක්ම අහිතකර වීම පමණයි. ඔබට මෙම ලෝකය සමඟ සම්බන්ධතාවයක් නොමැති සේය. ඔබගේ සම්බන්ධතාවය තිබෙන්නේ, දැන් ස්ථාපනය වන නව ලෝකය සමඟයි. අපි නව ලෝකය ස්ථාපනය කිරීමට උපකරණ වන බව, ඔබ දන්නවා. එබැවින් ඔබගේ අරමුණ සහ ඉලක්කය ඔබ ඉදිරියේ ඇත මා ඔවුන් මෙන් විය යුතුයි. ඔබ තුළ කිසිම රකුසු ගති තබා නොගන්න. ආධ්‍යාත්මික සේවයේ නියැලීමෙන් බොහෝ ප්‍රගතියක් ඇතිවිය හැක. ඔබ ප්‍රදර්ශන සහ කලාගාර විවෘත කරන විට, බොහෝ මිනිසුන් පැමිණෙන බවත්, ඔවුන්ද පරම පියාව සිහි කිරීමට ආරම්භ වන අන්දමින්, ඔවුන්ට පරම පියාගේ හැඳින්වීම ලබා දීමට හැකි වෙයි කියා ඔබ විශ්වාස කරයි. මුළු දවස පුරාම මෙම සිතිවිලි පමණක් ඇති කරන්න. මධ්‍යස්ථානයක් විවෘත කර, සේවය වැඩි කරන්න. ඔබට සියලුම මැණික් තිබේ. දිව්‍යමය ගුණදම් ධාරණය කිරීමට පරමාත්ම පියා ඔබව දිරිමත් කරන අතර, ඔබට නිදන් ද ලබා දෙයි. මෙතැන අසුන් ගෙන සිටින අතර, ඔබ ලෝකයේ මුල, මැද සහ අවසානය දන්නා බව, ඔබගේ බුද්ධිය තුළ ඇත. ඔබ පිවිතුරුවද රැඳී සිටියි. ඔබගේ සිතිවිලි, වචන හෝ ක්‍රියා මඟින් කිසිම නරක ක්‍රියාවක් සිදු නොකළ යුතුයි. මේ

පිළිබඳව ඔබ තමන්ව බොහෝ ප්‍රවේසමින් පිරික්සිය යුතුයි. පියා පැමිණ සිටින්නේ අපවිත්‍ර අය, පිවිතුරු කිරීමටයි. ඔහු මේ සඳහා ඔබට දිගින් දිගටම ක්‍රමෝපේද පෙන්වා දෙයි. ඔබ මෙම ක්‍රමවේද ගැන දිගින් දිගටම සිතමින් තමන්ව ඒවායින් විනෝදමත් කළ යුතුයි. මධ්‍යස්ථානයක් විවෘත කර, බොහෝ දෙනෙකුට ආරාධනාවක් ලබා දී, ඉන්පසුව අසුන් ගෙන, බොහෝ සෙනෙහසින් යුතුව ඔවුන්ට විස්තර කර දෙන්න මෙම පැරණි ලෝකය විනාශ වීමටයි යන්නේ. පළමුවෙන්ම නව ලෝකය ස්ථාපනය කිරීම බොහෝ වැදගත්ය. ස්ථාපනය සිදුවන්නේ සංගම යුගයෙදීය. එය දැන් සංගම යුගය කියාවත්, මිනිසුන් නොදනී. නව ලෝකය ස්ථාපනය කිරීම සහ පැරණි ලෝකයේ විනාශය අතර සංගමය, දැන් බව, ඔබ විස්තර කළ යුතුයි. නව ලෝකය ස්ථාපනය වන්නේ ශ්‍රීමත් පිළිපැදීමෙනි. පැමිණ, නව ලෝකය විවෘත කිරීමට ඔය දරුවන්ට මඟ පාදන්නේ, පරම පියා පමණයි. ඔහු මෙය තනිවම නොකරයි ඔහු ඔහුගේ සියලුම දරුවන්ගේ උපකාර ලබා ගනී. ඒ මිනිසුන් යම් දෙයක් විවෘත කිරීමට කිසිම උදව්වක් ලබා නොගන්නා අතර, ඔවුන් නිකම්ම ගොස් කතුරකින් පීත්ත පටියක් කපයි. මෙහිදී එසේ නොවෙයි. මෙහි, බ්‍රහ්මණ වංශයේ සැරසිල්ල වන ඔබලා, උදව්කරුවන් වෙයි. සියලු මනුෂ්‍යයන් සම්පූර්ණයෙන්ම අතරමං වී සිටියි. අපවිත්‍ර ලෝකය පිවිතුරු කිරීමේ කාර්යය පරමාත්ම පියාගේ පමණයි. නව ලෝකය ස්ථාපනය කරන්නේ පියා පමණක් වන අතර, ඔහු ඔබට ආධ්‍යාත්මික ඥානය ලබා දෙන්නේ මේ සඳහාය. නව ලෝකය ස්ථාපනය කිරීමේ ක්‍රමවේදය පරම පියාට ඇති බව ඔබ දන්නවා. මිනිසුන් භක්ති මාර්ගයේදී ඔහුට කන්නලව් කරති අහෝ පාරිශුද්ධකරුවාණෙනි වඩිනු මැනව! මිනිසුන් දිගින් දිගටම ශිවාට වන්දනා කරන නමුත්, පාරිශුද්ධකරු වන්නේ කවුරුන්ද කියා ඔවුන් නොදනී. ඔවුන් දුකට පත් වූ විට, ඔහු සිහි කර මෙසේ කියයි අහෝ දෙවියනි! අහෝ රාමා! අශාරීරික කෙනාට රාමා කියාද කියයි. අශාරීරික කෙනාට උසස්ම දෙවියන් යැයි කියයි. කෙසේවෙතත්, මිනිසුන් බොහෝ අවුලට පත්ව සිටියි. ඔවුන් මීදුමක අතරමං වී ඇති සේය! පරමාත්ම පියා පැමිණ ඔබගේ ව්‍යාකූලත්වය ඉවත් කර ඇත. මෙය අසීමිත කරුණක්. ඔවුන් විශාල වනයක සිරවී සිටියි. ඔබ සිටියේ කුමන වනයේද කියා, පරම පියා ඔබට දැනෙන්නට සලස්වා ඇත. මෙම ලෝකය පැරණි බවත්, එය එහි අවසානයේ තිබෙන බවත්, ඔබ දැන් දන්නවා. මිනිසුන් කොහෙත්ම මාර්ගය නොදනී! ඔවුන් දිගින් දිගටම පියාට අඬ ගසති. ඔබ තව දුරටත් අඬ ගසන්නේ නැත. ඔය දරුවන් දැන් නාටකයේ මුල, මැද සහ අවසානය දන්නා අතර, එයද අංකානුරූපයි. මෙය දන්නා අය බොහෝ සතුටින් සිටියි. ඔවුන් අන් අයට මාර්ගය පෙන්වීමේ නියැලී සිටියි. පියා අඛණ්ඩව පවසන්නේ විශාල මධ්‍යස්ථාන විවෘත කරන්න. ඔබට විශාල පිංතූර තිබේ නම්, මිනිසුන්ට පහසුවෙන් වටහා ගැනීමට හැකි වෙයි. දරුවන්ට අනිවාර්යෙන් සිතියම් (දැන්වීම්) අවශ්‍යයි මෙයත් පාසැලක් බව ඔබ පෙන්වා දිය යුතුයි. මෙහි ඇති මෙම සිතියම් (දැන්වීම්) බොහෝ ආශ්චර්යමත්ය. පාසැල් වල තිබෙන සිතියම් වල ඇත්තේ සීමිත දේවල්ය. මේවා අසීමිත කරුණුයි. පරමාත්ම පියා අපට ලෝකයේ මුල, මැද සහ අවසානය පිළිබඳ රහස් විස්තර කර දී අපව වටිනා බවට පත් කරවන විශ්වවිද්‍යාලයකි මෙය. මෙය මනුෂ්‍යයන්ගෙන් දේවතාවන් බවට පරිවර්ථනය වීමට තිබෙන දේවමය විශ්වවිද්‍යාලයයි. 'ලෝක ආධ්‍යාත්මික විශ්වවිද්‍යාලය' කියා ලියා ඇත. මෙය ආධ්‍යාත්මික විශ්ව විද්‍යාලයකි. ඔබ 'දේවමය විශ්වවිද්‍යාලය' කියා පමණක් ලිවීමෙන්, මිනිසුන්ට වටහා ගැනීමට නොහැක. ඔබ 'විශ්වවිද්‍යාලය' යන වචනය ලිවිය යුතුයි. මෙවන් වෙනත් දේවමය විශ්වවිද්‍යාලයක් නැත. සමහර වචන වැරදීමකින් අතපසු වී ඇති, ඇතැම් කාඩ්පත් බාබා දැක ඇත. බාබා ඔබට බොහෝ වාර ගණනාවක් 'ප්‍රජාපිතා' යන වචනය අනිවාර්යෙන්ම ලියන්නට යැයි, කියා තිබෙන නමුත්, ඒ තිබියදී දරුවන්ට එසේ කිරීමට අමතක වෙයි. මෙය විශාල දේවමය කොලීජියක් කියා මිනිසුන්ට දැන ගත හැකි අන්දමින්, වචන නිවැරදිව ලිවිය යුතුයි. සේවයේ නියැලී සිටින, ඉතා හොඳ සේවය කළ හැකි දරුවන්ගේ හදවතේ, යම් විශේෂිත වූ මධ්‍යස්ථාන වලට ගොස් ඒවා නඟා සිටුවීමට ආශාවක් තිබේ එම මධ්‍යස්ථාන මන්දගාමී වී ඇති බැවින්, ගොස් ඔවුන්ව අවදි කිරීමට ඔවුන්ට අවශ්‍යතාවයක් තිබේ, මන්ද, මායා කෙබඳුද යත්, ඇය නැවත නැවතත් ඔවුන්ව නින්දට යවයි. ඔවුන් ස්වදර්ශන චක්‍රධාරීන් බවත් ඔවුන්ට අමතක වෙයි. මායා බොහෝ එදිරිවාදිකම් ඇති කරයි. ඔබ සිටින්නේ සටන් බිමකයි. ඇය ඔබගේ හිස වෙනතක හරවා, ඔබව වැරදි දිශාවක ගෙන නොයන පරිදී, ඔබ බොහෝ සේ ප්‍රවේශම් විය යුතුයි. බොහෝ දෙනෙක් මායාගේ කුණාටු වල බලපෑමට හසුවෙයි. තරුණ, මහළු සැම කෙනෙක්ම සිටින්නේ සටන් බිමකයි. මායාගේ කුණාටු වලට ශක්තිමත් අයව චංචල කළ නොහැක. එම ස්ථිතිය ඉදිරියට පැමිණීමට තිබේ. පරමාත්ම පියා විස්තර කරන්නේ කාලයන් බොහෝ නරක අතර, තත්ත්වයන් ඉතා නරකයි. සියලුම රාජධානි විනාශ වීමට තිබේ. ඔවුන් සැම කෙනෙකුගේම සිහසුන් අහිමි කරවන අතර, ඉන්පසුව මුළු ලෝකය පුරාම එය මිනිසුන් මිනිසුන්ව පාලනය කිරීම වෙයි. ඔබ ඔබගේ නව රාජධානිය ස්ථාපිත කරන බැවින්, මෙහි සියලුම රාජධානි වල සළකුණු අවසන් වෙයි. මිනිසුන් මිනිසුන්ව පාලනය කිරීම ඉන්පසුව දිගටම පැවතෙයි. මිනිසුන්ගේ පාලනයක් තිබෙන විට

පමණයි, ඔවුන් අතරේ සටන් සහ සණ්ඩු සරුවල් ඇති වන්නේ. ඇත්ත වශයෙන්ම ස්ව-ආධිපත්‍යයක් හෝ රාම රාජ්‍යයක් නැත. මේ නිසයි මුළු ලොව පුරාම සටන් තිබෙන්නේ. මෙකල සෑම තැනකම බොහෝ කලබල තිබේ. ඔබ ඔබගේම රාජධානිය ස්ථාපිත කරන බව ඔබ දන්නවා. ඔබ සෑම කෙනෙකුටම මාර්ගය පෙන්වනවා. පරමාත්ම පියා පවසන්නේ නිරතුරුවම මා පමණක් සිහි කරන්න. පියාගේ සිහි කිරීමේ සිට, අන් අයට ජීවාත්ම අවධානයට පත් වන්නට කියා පවසන්න. ශරීර අවධානය අත්හරින්න. ඔබගෙන් සෑම කෙනෙක්ම ජීවාත්ම අවධානයට පත් වී නැහැ. නැත, ඔබ තවමත් මෙය බවට පත් විය යුතුයි. ඔබ උත්සාහ දරන අතර අන් අයටද එසේ කිරීමට දිරිමත් කරයි. ඔබ සිහි කිරීමේ සිටීමට වෙර දරන නමුත් ඉන්පසුව ඔබට අමතක වෙයි. ඔබ දැරිය යුතු උත්සාහය මෙයයි. ප්‍රධානතම දෙය වන්නේ පරම පියා සිහි කිරීමයි. ඔහු දරුවන්ට කෙතරම් විස්තර කරයිද. ඔබට ඉතා හොඳ ඥානය ලැබෙයි. ප්‍රධානතම දේ වන්නේ පිවිතුරුව රැඳී සිටීමයි. පරම පියා පැමිණ සිටින්නේ ඔබව පිවිතුරු කිරීමටයි, එබැවින් ඔබ අපවිත්‍ර නොවිය යුතුයි. ඔබ සතෝප්‍රධාන් වන්නේ සිහිපත් කිරීමේ සිටීමෙන් පමණක් බව අමතක නොකරන්න. මායා බාධක සිදු කර, ඔබට අමතක කරවන්නේ මෙහිදීය. පරම පියා සිහිපත් කර, සතෝප්‍රධාන් වීමට, දිවා රෑ සැලකිලිමත් වන්න. ඔබගේ සිහිපත් කිරීම කෙතරම් ස්ථිර විය යුතුද යත්, අවසානයේදී ඔබ ඒකායන පියා හැර වෙනත් කිසිවෙකු සිහි නොකළ යුතුයි. එම කෙනා, සියල්ලන්ගේම පියා, පරමාත්ම දෙවියන්, උසස්ම-උසස් කෙනා බව, ප්‍රදර්ශන වල දී ද පළමුවෙන්ම විස්තර කරන්න. එම කෙනා, සියල්ලන්ගේම පියා, පාරිශුද්ධකරු සහ සියල්ලන්ටම විමුක්තිය පිරිනමන්නාය. දිව්‍යලෝකයේ නිර්මාණකරු ඔහු පමණයි. පරමාත්ම පියා පැමිණෙන්නේ සංගම යුගයෙදි පමණක් බව, ඔය දරුවන් දැන් දන්වා. ඔබට රාජයෝගාව උගන්වන්නේ පරමාත්ම පියා පමණයි. පාරිශුද්ධකරු විය හැක්කේ වෙනත් කිසිවෙකුට නොව, ඒකායන කෙනාට පමණි. පළමුවෙන්ම ඔබ පියාගේ හැඳින්වීම ලබා දිය යුතුයි. ඔබ අසුන් ගෙන, එක් එක් කෙනාට වෙන වෙනම සෑම පිංතූරයක්ම විස්තර කරන්නේ නම්, මෙතරම් විශාල සෙනගකට ඔබ විස්තර කරන්නේ කෙසේද? කෙසේවෙතත්, විස්තර කළ යුතු පළමුවන සහ ප්‍රධානතම දේ වන්නේ පියාගේ පිංතූරයයි. බොහෝ දෙනෙක් කෙරෙහි භක්තිය තිබෙන නමුත්, ඥානය ලැබෙන්නේ එක් අයගෙන් පමණක් බව, ඔබ විස්තර කළ යුතුයි. පියා ඔය දරුවන්ට බොහෝ ක්‍රම පෙන්වයි. ඒකායන පියා පමණයි පාරිශුද්ධකරු වන්නේ එමෙන්ම ඔහු ඔබට මාර්ගයද පෙන්වයි. ගීතාව පැවසුවේ කවදාද කියා කිසි කෙනෙක් නොදනී. තඹ යුගයට, සංගම යුගය යැයි කිව නොහැක. පරමාත්ම පියා සෑම යුගයකදීම පැමිණෙන්නේ නැත. මනුෂ්‍යයන් සම්පූර්ණයෙන්ම අවුලට පත් වී ඇත. දවස පුරාම ඔබ සිතන්නේ අන් අයට විස්තර කරන්නේ කෙසේද කියාය. පරම පියා ඔබට උපදෙස් දී තිබේ. ඔබට ටේප් පටියකින් සම්පූර්ණ මුරලියකට සවන් දිය හැක. ඇතැම් අය පවසන්නේ, ඔවුන් පටයකට සවන් දෙන නමුත්, සෘජුවම බාබාට සවන් නොදෙන්නේ මන්ද කියා ඔවුන්ට සිතෙන බැවින්, ඔවුන් පෞද්ගලිකව මෙහි පැමිණෙන බවයි. ඔය දරුවන් බොහෝ සේවය කර, අන් අයට මාර්ගය පෙන්විය යුතුයි. මිනිසුන් ප්‍රදර්ශන වලට පැමිණෙන විට මෙය හොඳ බව පවසන නමුත්, ඔවුන් පිටත, මායාගේ පරිසරයට ගිය විට, සෑම දෙයක්ම ඉගිලී යයි. ඔවුන් ඥානය ආවර්ජනය නොකරයි. එවිට ඔබ ඔවුන් ගැන සොයා බැලිය යුතුයි. ඔවුන් පිටතට ගිය විට, මායා ඔවුන්ව ඇද ගනී ඔවුන් ලෞකික වැඩ වල සිරගත වෙයි. මධුබාන් සිහි කෙරෙන්නේ මේ නිසාය. ඔබට දැන් වැටහීම ලැබී තිබේ. ගීතාවේ දෙවියන් කවුරුන්ද කියා, ඔබට ඕනෑම තැනකට ගොස් විස්තර කළ හැක. පෙර කල, ඔබද, ඔවුන් දැන් කරන්නාක් සේ, ගොස් හිස නැමුවේය. ඔබ දැන් සම්පූර්ණයෙන්ම වෙනස් වී ඇත. ඔබ භක්තියේ යෙදීම නවතා ඇත. ඔබ දැන් මනුෂ්‍යයන්ගෙන් දේවතාවන් බවට පරිවර්ථනය වෙනවා. සියලුම ඥානය ඔබගේ බුද්ධිය තුළ තිබේ. ප්‍රජාපිතා බ්‍රහ්ම කුමර කුමරියන් කවුරුන්ද කියා, අන් අය දන්නේ මොනවාද? ඔවුන්ද ඇත්ත වශයෙන්ම ප්‍රජාපිතා බ්‍රහ්ම කුමර කුමරියන් බව, ඔබ විස්තර කරයි. ස්ථාපනය, බ්‍රහ්ම තුළින් සිදුවන්නේ මෙකලයි. බ්‍රහ්මණ වංශයද අනිවාර්යෙන්ම තිබිය යුතුයි. බ්‍රහ්මණ වංශය පවතින්නේ සංගම යුගයෙදීය. මුල් කාලයේදී බ්‍රහ්මණ මුදුන් මල්කඩ, ඉතා සුප්‍රසිද්ධ විය. ඔවුන්ගේ හිස් මුදුනේ කොණ්ඩ ගැටය හෝ සාළුව නිසා, ඔවුන්ව හින්දූන් ලෙස හඳුනාගත්හ. දැන් එම සලකුණු ද අතුරුදහන්ව ගොසින්ය. ඔබ බ්‍රහ්මණයින් බව, ඔබ දැන් දන්නවා. ඔබ බ්‍රහ්මණයින් වූවාට පසුව, ඔබට දේවතාවන් විය හැක. නව ලෝකය ස්ථාපිත කළේ බ්‍රහ්මණයන්ය. ඔබ යෝගා බලය තුළින්, සතෝප්‍රධාන් වනවා. ඔබ තමන්ව පරීක්ෂා කළ යුතුයි. කිසිම රකුසු ගතියක් තබා නොගන්න. ලුණු වතුර මෙන් නොවන්න. මෙය යාග හෝමයකි. යාගහෝමයක් ඇති තැන, සෑම කෙනෙක්වම රැක බලා ගැනෙයි. යාගහෝම බලාගැනීමට භාරකරුවන් සිටියි. යාගහෝමයේ අධිපති, ශිව බාබාය. මෙම බ්‍රහ්ම, භාරකරුවෙකි. යාග ගින්න රැකබලා ගත යුතුයි. ඔය දරුවන්ට අවශ්‍ය කුමක් වුවත්, යාගයෙන් එය ලබා ගත හැක. ඔබ අන් අයගෙන් යමක් පිළිගෙන, එය පළඳින්නේ නම්, ඔබ ඔවුන්ව දිගටම සිහි කරනු ඇත. ඔබගේ බුද්ධියේ රේඛාව, මේ පිළිබඳව ඉතා පැහැදිලි විය යුතුයි. ඔබ දැන් ආපසු

නිවසට යා යුතුයි. ඉතිරිව තිබෙන්නේ ඉතාමත්ම කෙටි කාලයකි. එබැවින් ඉතා ස්ථිරව සිහිපත් කිරීමේ වන්දනාවේ රැඳී සිටින්න. ඔබ දැරිය යුතු එකම උත්සාහය මෙයයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. දියුණු වීම සඳහා, ආධ්‍යාත්මික සේවයේ නියැලී සිටින්න. ඔබට ලැබී ඇති සියලුම ඥානයේ මිණි මුතු ධාරණය කරගෙන, අන් අයටත් එසේ කිරීමට දිරිගන්වන්න.
2. ඔබට කිසි යම් රකුසු ගතියක් තිබේද කියා පරීක්ෂා කර බලන්න. මා භාරකරුවෙක් ලෙසින් ජීවත් වනවාද? මා කිසි විටෙක හෝ ලුණු වතුර මෙන් වනවාද? මාගේ බුද්ධියේ රේඛාව පැහැදිලිද?

**වරදානය:** ඔබ සියලු අංශ වලින් පිරිපුන් අයෙකු වී, උත්සාහය දැරීමේ දී සියුම් කම්මැලිකමක් පවා අත්හැරීමෙන් අවදියෙන් හා නිති සූදානමින් සිටිත්වා.
උත්සාහය දැරීමෙන් වෙහෙසට පත්වීම කම්මැලිකමේ සලකුණකි. කම්මැලි අය ඉක්මනින් වෙහෙසට පත් වන අතර, උද්‍යෝගය ඇති අය වෙහෙසින් තොරය. තම උත්සාහයන් ගැන අධෛර්යයට පත්වන අයට කම්මැලිකම ඇති වන අතර, "මට කුමක් කළ හැකිද? මට කළ හැක්කේ එපමණයි, මට තවත් කළ නොහැක. මට කිසිම ධෛර්යයක් නැත; මම ඉදිරියට යමින් සිටිමි, මම සියල්ල කරමි" යනුවෙන් සිතති. දැන්, මේ සියුම් කම්මැලිකමේ කිසිදු නමක් හෝ සලකුණක් ඉතිරි වීමට ඉඩ නොදෙන්න. මේ සඳහා, ඔබ නිරන්තරව අවදියෙන්, නිති සූදානමින් සහ සියලු අංශ වලින් පිරිපුන් අයෙකු විය යුතුය.

**පාඨය:** මෙම කාලයේ වැදගත්කම ඔබ ඉදිරියේ තබා ගැනීමෙන්, ඔබ ඔබේ ගිණුමේ සියලු ලැබීම් සම්පූර්ණයෙන්ම රැස් කර ගනු ඇත.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: දැන් සම්පූර්ණ හා කර්මාතීත් වීමේ ගැඹුරු සැලකිල්ල ඇති කරගන්න.**

ඔබේ උසස් මනෝ ස්ථිතියේ, ශබ්දයෙන් ඔබ්බෙහි ස්ථාවර වන්න, එවිට ඔබේ මනෝ ස්ථිතිය සියලු දළ ආකර්ෂණයන්ගෙන් ඔබ්බෙහි බලවත්, ආදරණීය සහ නොබැඳි වනු ඇත. ඔබ මෙම උසස් මනෝ ස්ථිතියේ තත්පරයක් හෝ ස්ථාවරව සිටියහොත්, එහි බලපෑම වනුයේ දවස පුරා ක්‍රියා කරන අතරතුර, ඔබ තුළම නිශ්ශබ්දතාවයේ බලය විශේෂයෙන් අත්විඳීමයි. මෙම අවධිය කර්මාතීත් අවධිය, පරිසමාප්ත අවධිය, එය පියාගේ අවධියට සමාන අවධිය ලෙස හැඳින්වේ.